## 7 ශ්‍රේණිය සිංහල - 1 පාඩම- ගොවි බිරියගේ නුවණ

ජන වහරෙන් උපන් ප්‍රස්තාව පිරුළු.

========================================


අතීතයේ ජනතාව අතරේ භාෂාව පදනම්ව ඉතා ප්‍රහල අර්තයන් එක් වචනයකින්,වාක්‍යකින් ප්‍රකාශ කිරීමට තරම් සංවිධානය වූ භාෂා භාවිතයක් දක්නට ලැබුනී. එම ලක්ෂණය අතුරෙන් ප්‍රස්තාව පිරුළු වලට ලැබෙන්නේ ප්‍රධානම තැනකී.ප්‍රස්තා පිරුලක් මගින් විශාල අදහසක් එක් වාක්‍ය කොටසකින් ඉදිරිපත් කිරීම විශේෂත්වයයි.මෙහිදී කිවයුතු අදහස වඩ නඩාත් කැපී පෙනෙන ලෙසත් එය ත්‍රීව ලෙස ප්‍රකාශ කිරීම සඳහාත් අලංකාර ලෙස ගැමියා නිර්මාණය කරගත් වාක්‍ය කණ්ඩයක් මෙනමින් හැදින්විය හැකිය.
මෙම පිරුළු නිර්මාණය කිරීම්දී ගැමියා ඒ සදහා ජන කතාවක් එසේ නැත්නම් එයට සම්බන්ද කතාවක් යෙදාගෙන ඇති අතර එම පිරුලෙහි අර්තය එම කතාව මගින් මොනවට පැහැදිලි කරයි.මෙම පිරුළු කවදා කවුරු කොතනදී නිර්මාණය කලේද කිව නොහැකි අතර එම කතා සංදර්භයෙන් ඒ ඒ පිරුළු නිර්මාණය වූ කාලය ගැන විවිධ ඉගි ලබා ගත හැකි අවස්තාද නැතිවා නොවේ.එවන් පිරුළු කීපයක් එහි සරල අදහස සමග පහත පරිදී දැක්විය හැකිය.

1.අළු ගොඩට පිම්බා වගේ.
* අනවශ්‍ය කරදර අවුස්සන මෝඩ ක්‍රියාවක් කිරීම.
2.අවුව තියෙනකොට පිදුරු වේලාගත යුතුය.
* සුදුසු වේලාවෙදීම නියමිත කටයුත්ත කල යුතුය.
3. අළු කෙහෙල් නැත්තම් කළු කෙහෙලුත් හොදලු
* නියමිත දේ නොමතිනම් ඊලගට ගැලපෙන දේ හෝ ගත යුතුය.
4. අලි විකුනලා බැරිවෙලා තම්පලා විකුනලා හැකිද.
* විශාල ව්‍යාපාරයක් කර බැරි වු කෙනෙක් කුඩා දෙයක් කර දියුණුවේද.
5.අලි යන කපොලු තිබියදී කූඹී යන තවු වහනවා වගේ.
* ලොකු වැරදි තිබියදී පොඩි වැරදි සෑදීමට යාම.
6. අල්ලපු අත්තත් නෑ පය ගහපු අත්තත් නෑ.
* ලග තිබු දෙයත් බලාපොරොත්තු වු දෙයත් දෙකම නැතිවීම.
7. අනුන්ගේ මගුල් ගෙදරදී ආදර බත් බෙදන්නා වගේ
* අනුන්ගේ වියදමින් තම හිතවතුන්ට සංග්‍රහ කිරීම.
8. අත්හැරෙන දීගේ හෙවනැල්ලත් ඇදලු.
* යම් කිසිවක් අත්හැරීමට සිදු වූ විට එම් නැති වැරදි පවා සොයන බව.
9. ගල පිට වැපුරුවා වගේ.
* අවශ්‍ය කාරනය නොකර නිශ්පල ප්‍රයත්නයක යෙදීම.
10. ගලෙ පැහැරු බළලා වගේ.
* වැඩි දුර නොසිතා කල වැඩකින් පසු තැවීමට වීම.
11. කිරි ගහට ඇතු දළ දුන්කා වගේ.
* ස්තිරවම සිදුවන දෙයක කියවේ.
12. කිඹුලාට මගුල් ජෝඩු කලා වගේ.
* අනෙකෙකු රැවටීම ගැන කිවවේ.
13. කලකදි වහත් කලකදි රහ වෙනවාලු.
* කලකදී සතුරු අය වෙලාවකදී මිතුරු වීම.
14. කිරියාව හොදනම් ඒකමලු සිරියාව.
* යහපත් තැනත්තා ගැන කියවේ.
15. කපුරු දැවූ තැන අළුත් නැතිලු.
* කිසිවක් ඉතිරි නොවී විනාශවීම.
16. කබලෙන් ගිපට වැටුනා වගේ.
* කරදරයකින් තව කරදරයකට පත්වීම.
17.කරවල වෙලදාමෙ ඇවිත් සඳුන්වල මිල කුමකටද.
* තමන් පැමිණි කාරණාව මිසක් වෙනත් දෑ ගැන විමසීම නොවටී.
19. ඌරාගේ හොස්සේ රත්තරන් බදිනවා වාගේ.
* නුසුදුසු අයට ගරු නම්බු නාම දීම.
20. රෑ දුටු හීනේ වාගේ.
* දුටු දෙයින් ප්‍රයොජනයක් නොවන බව.
21. රිදී තිහකටජේසුස් වහන්සේ විකුණුවා වගේ.
* ධනයටඇති ආශාව නිසා විශාල අපරාධයක් කිරීම.

22. හද ඉල්ලා අඩනවා වගේ.
* නොලැබෙන දෙයක් ඉල්ලා ඇවිටිලි කිරීම.
23. හරක් අඩන්නේ උන්ගේ රැලටයි.
* කවුරුත් තමන්ගේ වර්ගයට වැඩි සැලකිලි කරන බව.
24. හරියන මගුලට අටුවේ තියෙන කෙමෙණත් ගංගරා වැවටනවාලු.
* හරියන වෙලාවට හැමදේම හරියනවා.
25. ළමාතැනී කම සායෙන් ගන්න බැරිලු.
* ඇඳුමෙන් පැළඳුමෙන් කෙනෙකුට තත්වය ලැබිය නොහැකි බව.

ලිපිය දීර්ග වීම වලක්වාලීමට තවත් කොටස් කීපයකින් ප්‍රස්තාව පිරුළු ගැන ඉදිරිපත් කරමි.

ජනවහර JANAVAHARA .




1212
[බෙදා ගැනීම් 13ක්](#)
[බෙදා ගන්න](#)